# ධම්මපදය

## පුප්ඵ වර්ගය (11-12 ගාථා)

**11.** ගාථාව

**"න පුප්ඵගන්ධෝ පටිවාතමේති - න චන්දනං තගරමල්ලිකා වා,**
**සතං ච ගන්ධෝ පටිවාතමේති - සබ්බා දිසා සප්පුරිසෝ පවාති"**

පදගතාර්ථය

| | | |
|---|---|---|
| **පුප්ඵගන්ධෝ** | - | මල් සුවඳ |
| **පටිවාතං** | - | උඩුසුළඟට |
| **න එති** | - | නො පැමිණෙයි |
| **චන්දනං** | - | සඳුන් සුවඳ ද |
| **තගරමල්ලිකා වා** | - | තුවරලා හා බෝලිද්ද මල් සුවඳ ද |
| **න (එති)** | - | (උඩුසුළඟට) නො යයි |
| **සතං** | - | (බුද්ධාදි) සත්පුරුෂයන්ගේ |
| **ගන්ධෝ** | - | (ශීල) සුගන්ධය |
| **පටිවාතං** | - | උඩුසුළඟට |
| **එති** | - | එයි |
| **සප්පුරිසෝ** | - | සත්පුරුෂ තෙමේ |
| **සබ්බා දිසා** | - | සියලු දිසාවන්හි |
| **පවාති** | - | (සිල් සුවඳින්) පැතිරෙයි |

භාවාර්ථය

මල් සුවඳ උඩුසුළඟට නො හමයි. සඳුන්, තුවරලා බෝලිද්ද මල් සුවඳ ද උඩුසුළඟට නො යයි. සත්පුරුෂයාගේ සිල් සුවඳ ම උඩුසුළඟෙහි යයි. සත්පුරුෂයාගේ සිල් සුවඳ සියලු දිශාවන්හි පැතිරෙයි.

**12.** ගාථාව

**"චන්දනං තගරං වාපි - උප්පලං අථ වස්සිකී**
**එතේසං ගන්ධජාතානං - සීලගන්ධෝ අනුත්තරෝ"**

පදගතාර්ථය

| | | |
|---|---|---|
| **චන්දනං** | - | සඳුන් |
| **තගරං වා** | - | තුවරලා ද |
| **උප්පලං** | - | උපුල් ද |
| **අථ** | - | යලිත් |
| **වස්සිකී** | - | දෑසමන් ද යන |
| **එතේසං ගන්ධජාතානං** | - | මේ සුගන්ධ සමූහයගේ සුවඳට වඩා |
| **සීලගන්ධෝ** | - | සිල් සුවඳ |
| **අනුත්තරෝ** | - | ඉතා උතුම් වේ. |

භාවාර්ථය

මල් සුවඳ උඩුසුළඟට නො හමයි. සඳුන්, තුවරලා, බෝලිද්ද මල් සුවඳ ද උඩුසුළඟට නො යයි. සත්පුරුෂයාගේ සිල් සුවඳ ම උඩු සුළඟෙහි යයි. සත්පුරුෂයාගේ සිල් සුවඳ සියලු දිශාවන්හි පැතිරෙයි.

**නිදන කථාව**

දිනක් විවේකයෙන් හුන් ආනන්ද තෙරණුවෝ 'බුදුරජාණන් වහන්සේ සඳුන් ආදි හර සුවඳ, හිරිවේරිය ආදි මුල් සුවඳ, දෑසමන් ආදි මල් සුවඳ උතුම් සුවඳ කොට වදරන සේක. එහෙත් ඒ හැම සුවඳ ම යටිසුළඟහි මුත් උඩුසුළඟෙහි නො යයි. උඩුසුළඟෙහි ද හමන සුවඳක් වේදෑ'යි සිතූහ. නැවත මෙය මා තීරණය කරනු තබා මෙහි ලා බුදුරජාණන් වහන්සේගේ තීරණය දනගැනීම වඩා හොඳ යැ'යි සිතා බුදුරජාණන් වහන්සේ වෙත ගියහ. ගොස් වැඳ "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! හර සුවඳ, මල් සුවඳ, මුල් සුවඳ යන මේ තුන් සුවඳ යටිසුළඟෙහි විනා උඩුසුළඟෙහි නො යයි. එහෙත් යටිසුළඟෙහි ද උඩුසුළඟහි ද යටිසුළඟෙහි හා උඩුසුළඟහි ද යන සුවඳක් තිබේදෑ"යි ඇසූහ. "ආනන්ද, එසේ යැ"යි වදළ විට ආනන්ද ස්ථවිරයන් වහන්සේ "ස්වාමීනී! මට එය පහදා දෙනු මැනවැ"යි කීහ.

බුදුරජාණන් වහන්සේ "ආනන්ද, ගමෙක හෝ නියම්ගමෙක වසන පුරුෂයෙක් හෝ ස්ත්‍රියක් බුදුරජාණන් වහන්සේ සරණ ගියේ, ධර්මරත්නය සරණ ගියේ, සංඝරත්නය සරණ ගියේ, සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයන්හි වරදවා හැසිරීම, බොරු කීම, සුරා පානය යන පස්පවින් වැළකී සිල්වත් වූයේ, යහපත් ගතිගුණ ඇත්තේ, මසුරුමල හැර ත්‍යාග ඇතිව දීමෙහි පිරිසිදු වූ අත් ඇති ව තම කොටස පවා බෙදා දී වැළඳීමෙහි ඇලී ගිහිගෙයි වෙසේ ද, එබඳු ස්ත්‍රීපුරුෂයන්ගේ ඒ උසස් ගුණය, දසදෙස වසන හැම මහණබමුණු කෙනෙක් ම සතුටින් කියති. දෙවියෝත් කියති. 'අසවල් පුරුෂයා, අසවල් ස්ත්‍රිය තුන්සරණයෙහි පිහිටා පස්පවින් වැළකී සිලවත් ව වෙසේ ය'යි ඒ හැම කෙනෙක් ම කියති. ආනන්දය! මෙබන්දන්ගේ ගුණසුවඳ යටිසුළඟ හා උඩුසුළඟ දෙකේහි ම නිතර පැතිරේයැ"යි වදරා මේ ගාථා වදළ සේක.

ධර්මදේශනාව අවසානයෙහි බොහෝදෙනා සෝවාන් ඵලාදියට පැමිණියෝ ය. දේශනාව මහජනයාට වැඩ සහිත විය.

**ආත්මෝපදේශය** - කොතරම් පාඩුවක් වුවත් අගතියට වහල් නො වන්න.

**සාධු ! සාධු !! සාධු !!!**

**ශ්‍රී සද්ධර්ම සංසදය**
**ධම්මාරාම යෝගාශ්‍රමය**
**(උඳුවප් 2552)**

**සම්පාදක:** පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසි
පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේ.

**පිටු සැකසීම:** පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත උපාසක මහතා.

**ධර්මදානය:** පින්වත් ආර්. ඩී. දයාසීලී උපාසිකා මාතාව විසින් අභාවප්‍රාප්ත ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් උපේක්ෂා පියරංගිකා මෙණෙවිය විසින් දෙමවුපියන්ට ආශීර්වාද පිණිස හා තමාට ධර්මාවබෝධය පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ධර්මදේශනා ඇතුළු පටිගත කරන ලද ධර්මදේශනා සහ පසුගිය දහම්ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2008**